# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 31 වැනි කාණ්ඩය | ජනවාරි 2023



*"සියලු අභියෝගයන් මැද සමස්ත ජනතාවගේ අපේක්ෂාවන් ඉටුකිරීමට වගකීමෙන් යුතුව නව වසරේ පෙළ ගැසෙමු"*

**- නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා**

අන් කවරදාටත් වඩා අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇති අවස්ථාවක රටේ උත්තරීතරම ආයතනයක කාර්ය මණ්ඩලය ලෙස ජනතා අපේක්ෂාවන් වගකීමෙන් ඉටුකිරීමට නව වසරේ පෙළ ගැසෙන මෙන් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා ජනවාරි මස 02 වැනිදා 2023 වසර සඳහා රාජ්‍ය නිලධාරීන් ප්‍රතිඥා / දිවුරුම් දීමේ වැඩසටහනට පාර්ලිමේන්තු සංකීර්ණයේ දී එක්වෙමින් අවධාරණය කළේ ය.

## පුවත්

- සියලු අභියෝගයන් මැද සමස්ත ජනතාවගේ අපේක්ෂාවන් ඉටුකිරීමට වගකීමෙන් යුතුව නව වසරේ පෙළ ගැසෙමු - නව වසරේ රාජකාරි ඇරඹීමේ අවස්ථාවට එක්වෙමින් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා පවසයි.

- මුජිබර් රහුමාන් මහතාගේ ඉල්ලා අස්වීම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී පුරප්පාඩුවක් පවතින බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා මැතිවරණ කොමිෂන් සභාවට දන්වයි.

- නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය මේ මස 27 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට අවසන් කරමින් ගැසට් නිවේදනය නිකුත් කෙරේ.නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය පෙබරවාරි 08 වැනිදා.

- නිල සංචාරයක් සඳහා දිවයිනට පැමිණි පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම් ස්ටීවන් ට්විග් මහතා මේ මස 13 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු වෙයි.

## කාරක සභා පුවත්

- විදේශගත වන ශ්‍රමිකයන්ගෙන් 56%කගේම අධ්‍යාපන මට්ටම අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා පමණයි - මානව හිමිකම් සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයේ කුරුණෑගල ශාඛාව (CHRCD) අනාවරණය කරයි.

- වින්දිතයන් බවට පත්වන දරුවන් අපහසුතාවට පත්වීම වැළැක්වීම සඳහා ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ මැදිහත්වීමෙන් පරිවාස නිලධාරීන්ට සාම විනිසුරු පත්වීම්

- විදේශීය ශ්‍රම වෙළඳපොළ වෙත ගුණාත්මක ශ්‍රමිකයින් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳ කෝපා අනුකමිටුවේ අවධානය.

- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය හෙවත් රැමිස් (RAMIS) පද්ධතිය කාර්යක්ෂම කිරීම සඳහා අනුකමිටු දෙකක්.

- විදේශ සේවා නියුක්ති කාර්යාංශය පසු විපරමට කැඳවයි - අමාත්‍යාංශ ලේකම් කරුණු 13 පිළිබද පිළිතුරු බඳී.

- නිලධාරීන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් සුභසාධක ප්‍රතිලාභීන්ගේ විනිවිද බවකින් යුතු නාමලේඛනයක් තවමත් සකස් කිරීමට නොහැකිවෙලා - රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී අනාවරණය වෙයි.

- කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා නිලධාරීන් ලෙස වඩාත් වගකීමෙන් කටයුතු කළ යුතුයි - රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අප්‍රසාදය පළ කරයි.

- ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වාගත යුතුයි - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) මධුර විතානගේ.

- ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය මුහුණපා ඇති ගැටලු පිළිබඳ ජාතික සභා අනුකාරක සභාවේ අවධානය.

- මාධ්‍ය වාර්තා කළ ආකාරයට දුම්රිය ගමන් වාර අවලංගු නොවූ බව අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී පෙන්වා දෙයි.

## විදු පියස

- පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩටහනක් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හුංගම විජයබා විද්‍යාලයේදී.

## ජායා ගැලරිය





# සියලු අභියෝගයන් මැද සමස්ත ජනතාවගේ අපේක්ෂාවන් ඉටුකිරීමට වගකීමෙන් යුතුව නව වසරේ පෙළ ගැසෙමු - නව වසරේ රාජකාරි ඇරඹීමේ අවස්ථාවට එක්වෙමින් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා පවසයි

## කවරයේ කතාව

අන් කවරදාටත් වඩා අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇති අවස්ථාවක රටේ උත්තරීතරම ආයතනයක කාර්ය මණ්ඩලය ලෙස ජනතා අපේක්ෂාවන් වගකීමෙන් ඉටුකිරීමට නව වසරේ පෙළ ගැසෙන මෙන් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය අමතමින් අවධාරණය කළේ ය.

2023 වසර සඳහා රාජ්‍ය නිලධාරීන් ප්‍රතිඥා / දිවුරුම් දීමේ වැඩසටහනට පාර්ලිමේන්තු සංකීර්ණයේ දී ජනවාරි මස 02 වැනිදා එක්වෙමින් නියෝජ්‍ය කථානායකවරයා මේ බව පවසා සිටියේ ය.

කොවිඩ් අභියෝගය ජයගැනීමෙන් පසු ආර්ථික අර්බුදයට මුහුණදීමට සිදුවූ බවත්, ඒ අනුව පවතින දුෂ්කරතා ජය ගැනීම සඳහා රාජ්‍ය සේවකයන්හට සුවිසල් වගකීමක් පැවරෙන බවත්, ඒ මහතා පෙන්වා දුන්නේය. විශේෂයෙන් රාජ්‍ය සේවකයන් විශාල පිරිසක් එකවර විශ්‍රාම ගන්නා පසුබිමක වෙනදාටත් වඩා අභියෝගාත්මක පරිසරයක ජනතාව වෙනුවෙන් සිය වගකීම් කොටස ඉටුකිරීමට සිදුව ඇති බව ද නියෝජ්‍ය කථානායකවරයා මෙහිදී පෙන්වා දුන්නේ ය.

නියෝජ්‍ය කථානායකවරයා විසින් පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලේ ඉදිරිපස ප්‍රධාන පියගැට පෙළ අසලදී ජාතික කොඩිය එසවීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය නව වසරේ රාජකාරි ඇරඹීමේ චාම් උත්සවය ආරම්භ කරන ලදී.
ඉන් අනතුරුව රණවිරුවන් ඇතුළු දේශය වෙනුවෙන් දිවිකැප කළ සියලු දෙනා සැමරීම උදෙසා විනාඩි 02 ක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කෙරිණි.

පාර්ලිමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයෝ එක්ව රාජ්‍ය සේවා ප්‍රතිඥාව / දිවුරුම් දීම සිදු කළේ ඉන් පසුව ය.

නව වසරේ රාජකාරි ආරම්භ කිරීමේ උත්සවයේ දී අදහස් දැක්වූ පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් කුෂාණි රෝහණදීර මහත්මිය පවසා සිටියේ පවතින දුෂ්කරතාවලින් රට මුදවා ගැනීම සඳහා අභියෝගාත්මක පරිසරය තුළ උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව සේවය කළයුතු බවයි. පාර්ලිමේන්තුවේ නව කාරක සභා රැසක් ස්ථාපිත කිරීමට නියමිත බවත් ඒ අනුව බදවා ගැනීම් සහ මූල්‍ය ප්‍රතිපාදන සීමා වී ඇති පසුබිමක වඩාත් කැපවීමෙන් එකම පවුලක් ලෙස කටයුතු කළ යුතු බවත් නියෝජ්‍ය මහ ලේකම්වරිය අවධාරණය කර සිටියා ය.

එසේම පැවති කොවිඩ් අභියෝගය තුළ පාර්ලිමේන්තු කටයුතු බාධාවකින් තොරව සිදුකිරීම සඳහා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය දැක් වූ දායකත්වය පිළිබඳව ද නියෝජ්‍ය මහලේකම්වරිය සිය ස්තුතිය පළකර සිටියා ය.

මේ අවස්ථාවට පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා, දෙපාර්තමේන්තු ප්‍රධානීහු සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය මෙන්ම අනුබද්ධ කාර්ය මණ්ඩලයද එක්ව සිටියහ.

## පුවත්

# මුජිබර් රහුමාන් මහතාගේ ඉල්ලා අස්වීම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී පුරප්පාඩුවක් පවතින බව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා මැතිවරණ කොමිෂන් සභාවට දන්වයි



කොළඹ මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහොමඩ් මුජිබර් රහුමාන් මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය තමා වෙත භාරදුන් බව පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ලිපියක් යොමු කරමින් දන්වා තිබේ.

ගරු මුජිබර් රහුමාන් මහතාගේ ලිපියට අනුව ඉහත ඉල්ලා අස්වීම මේ මස 20 වැනිදා සිට බලපැවැත්වෙන බව ද මහ ලේකම්වරයා දන්වා තිබේ.

ඒ අනුව නවවැනි පාර්ලිමේන්තුවේ මුජිබර් රහුමාන් මහතාගේ අසුන හිස්ව ඇති බව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(1) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙන බව ද මහ ලේකම්වරයා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත දන්වා සිටියේ ය.







# පුවත්

## "නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය පෙබරවාරි 08 වැනිදා"


■ තෙවැනි සභාවාරය මේ මස 27 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට අවසන් කරමින් ගැසට් නිවේදනය නිකුත් කෙරේ

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් මේ මස 27 වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව එතුමාට පැවරී ඇති බලතල අනුව පාර්ලිමේන්තුව වාරාවසාන කරන ලද අතර නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය පෙබරවාරි 08 වැනිදා පූර්ව භාග 10.00 ට ආරම්භ කරන ලෙස ප්‍රකාශයට පත් කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (අ) සහ (ආ) අනු ව්‍යවස්ථා අනුව පාර්ලිමේන්තුවේ එක් සභාවාරයක් අවසන්කොට නව සභාවාරයක් ආරම්භ කරන අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කොට මුලසුන දරමින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ඇත.

පාර්ලිමේන්තුව වාරාවසාන කළ විට එතෙක් යථා පරිදි පාර්ලිමේන්තුව විසින් සලකා නොබලන ලද ප්‍රශ්න සහ යෝජනා අහෝසි වන අතර මන්ත්‍රීවරුන් නැවත වාරයක් ඒ සම්බන්ධව ස්ථාවර නියෝග අනුව කටයුතු කළ යුතු ය. තව ද පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරණ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, විශේෂ කාරක සභා සහ ආංශික අධීක්ෂණ කාරක සභා හැර අනෙකුත් සියලු කාරක සභා නව සභාවාරයේ දී නැවත පත්කළ යුතු ය.

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය 2020 අගෝස්තු 20 සිට 2021 දෙසැම්බර් 12 දක්වාත්, දෙවැනි සභාවාරය 2022 ජනවාරි 18 සිට 2022 ජූලි 28 දක්වාත් පවත්වා තිබේ. ඒ අනුව නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරය 2022 අගෝස්තු 03 දින ආරම්භ වූ අතර මේ මස 27 වැනිදා වාරාවසාන කරන මොහොත වන විට පාර්ලිමේන්තුව දින 58ක් රැස් වී තිබේ.



# පුවත්

## නිල සංචාරයක් සඳහා දිවයිනට පැමිණි පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම් ස්ටීවන් ට්විග් මහතා මේ මස 13 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු වෙයි.

නිල සංචාරයක් සඳහා දිවයිනට පැමිණි පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම් ස්ටීවන් ට්විග් මහතා මේ මස 13 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු විය.

එසේම ස්ටීවන් ට්විග් මහතා මේ මස 11 වැනිදා අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා හමු විය.

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම්වරයා සිය පාර්ලිමේන්තු සංචාරයේ දී අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායක ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා ද හමුවිය. තව ද රාජ්‍ය අමාත්‍ය ගරු සුරේන් රාඝවන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු යදාමිණී ගුණවර්ධන යන මහත්වරුන් සමග ද සුහද සාකච්ඡාවන්ට එක්විය.

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම්වරයා සමග එම සංගමයේ උපාය මාර්ගික අංශ ප්‍රධානී එමිලි ඩේවිස් මහත්මිය ද මෙම අවස්ථාවන්ට එක්ව සිටි අතර ඔවුහු පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර, සහකාර මහ ලේකම් ටිකිරි ජයතිලක යන මහත්ම මහත්මීහු සමග ද සුහද සාකච්ඡාවක නිරත වූහ. ඉන් අනතුරුව ඔවුහු පාර්ලිමේන්තු පරිශ්‍රයේ විශේෂ සංචාරයක නිරත වූහ.

පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ මහ ලේකම්වරයා පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද හමුවී ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා පවතින ඉදිරි අවස්ථා සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡාවල නිරත විය.











# කාරක සභා පුවත්



# විදේශගත වන ශ්‍රමිකයන්ගෙන් 56%කගේම අධ්‍යාපන මට්ටම අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා පමණයි - මානව හිමිකම් සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයේ කුරුණෑගල ශාඛාව (CHRCD) අනාවරණය කරයි

විදේශගත වන ශ්‍රමිකයන්ගෙන් 56%කගේ අධ්‍යාපන මට්ටම අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා පමණක් බව මානව හිමිකම් හා ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයේ කුරුණෑගල ශාඛාව  අනාවරණය කර සිටී. මෙම තොරතුරු අනාවරණය වී ඇත්තේ සංක්‍රමණික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ සංක්‍රමණික සේවා ගිවිසුම් පිළිබඳ සිදු කරන ලද සමීක්ෂණයක් මගිනි.





ඉහත කරුණු අනාවරණය වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය)  ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතිත්වයෙන් මේ මස 18 වැනිදා පැවති පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසද රැස්වීමේදීය.

මැදපෙරදිග රටවලට සංක්‍රමණය වන සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් බහුතරයක් පුද්ගලික ආයතන හරහා විදෙස්ගත වන බවත්, එහි දී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා පමණක් වුව ද, ඔවුන්ගෙන් 52% ක ප්‍රතිශතයක් සංක්‍රමණ සේවා ගිවිසුම ඉංග්‍රීසි භාෂාවෙන් අත්සන් කරන අතර අනෙකුත් සංක්‍රමණික ශ්‍රමිකයන්  එම ගිවිසුම් අරාබි භාෂාවෙන් අත්සන් කරන බවත් එහි දී අනාවරණය විය. එබැවින් විදේශ සංක්‍රමණික ශ්‍රමිකයෙකු එවැනි සංක්‍රමණික සේවා ගිවිසුමක් අත්සන් කරනුයේ ඒ පිළිබඳ නිසි අවබෝධයකින් ද යන්න පිළිබඳ කමිටුවේ අවධානය යොමු විය.

එමෙන්ම, සංක්‍රමණික ශ්‍රමිකයින්ගෙන් 60% ක් කුවේටයට සහ ඉතිරි පිරිස සෞදි අරාබිය සහ අනෙකුත් මැදපෙරදිග රටවලට සංක්‍රමණය වන අතර, රැකියා සඳහා සංක්‍රමණය වන පිරිසෙන්  70% ක්ම ගෘහ සේවිකාවන් බව ද මෙහි දී වැඩිදුරටත් අනාවරණය විය.



# වින්දිතයන් බවට පත්වන දරුවන් අපහසුතාවට පත්වීම වැළැක්වීම සඳහා ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ මැදිහත්වීමෙන් පරිවාස නිලධාරීන්ට සාම විනිසුරු පත්වීම්

## ▪ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ මැදිහත්වීමට අධිකරණ අමාත්‍යවරයාගෙන් කඩිනම් ප්‍රතිචාර







වින්දිතයන් බවට පත්වන දරුවන්ට නෛතික කටයුතුවලදී අවශ්‍යවන දිවුරුම් ප්‍රකාශ ලබා ගැනීමේ දී සිදුවන අපහසුතාව මගහරවා ගැනීමට  පරිවාස නිලධාරීන්ට සාම විනිසුරු පත්වීම් ලබා දීම අධිකරණ අමාත්‍ය ගරු ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා සහ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිනිය වන පාර්ලිමේන්තු මන්ත්‍රිනි ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන්  මේ මස 19 වැනිදා පාර්ලිමේන්තුවේ දී සිදුවිය.

මේ අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා සේවය කරන පරිවාස නිලධාරීන් 325 ක් දෙනෙකු සඳහා සාම විනිසුරු පත්වීම් ලබා දීමට අවශ්‍ය අයදුම්පත්‍ර කාන්තා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් යමුනා පෙරේරා මහත්මියට සංකේතාත්මකව පිළිගැන්විණි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ සභාපතීත්වයෙන් පසුගිය දෙසැම්බර් 02 වැනිදා පැවති ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ රැස්වීමට පරිවාස හා ළමාරක්ෂණ සේවා කොමසාරිස්වරයා ඇතුළු පළාත් කොමසාරිස්වරු සම්බන්ධ වූ අතර එහි දී සිය ගැටලු සහ යෝජනා සංසදය වෙත ඉදිරිපත් කිරීමට ඔවුන්ට අවස්ථාව හිමි විය. එහි දී ඔවුන් පෙන්වා දුන්නේ අධිකරණ ක්‍රියාවලිය තුළ  පරිවාස භාරයේ සිටින වින්දිත දරුවන් දිවුරුම් ප්‍රකාශ ලබා ගැනීම සඳහා තෙවැනි පාර්ශ්වයකට යොමු කිරීමේදී අපහසුතාවට පත්වන බවයි. මේ අනුව ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදය විසින් මෙම යෝජනාව අධිකරණ අමාත්‍යවරයාගේ අවධානයට ඉදිරිපත් කරන ලදී.

මෙම අවස්ථාවට එක්වූ අධිකරණ අමාත්‍ය ගරු ආචාර්ය විජේදාස රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේ කාලීන ගැටලුවක් විසදීම සඳහා ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ මැදිහත්වීම ප්‍රශංසනීය බවයි. ඉදිරියේදීත් මෙවැනි සාධනීය පියවර සඳහා හැකි සෑම පියවරක්ම ගන්නා බව ඒ මහතා පැවසීය.

එසේම මෙහි දී අදහස් දැක්වූ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය පවසා සිටියේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති මෙම ගැටලුවට විසදුම් ලබා දීමට හැකිවීම මෙරට ළමා ප්‍රජාව ලැබූ

ජයග්‍රහණයක් බවයි.තව ද මෙම සංසදයේ මැදිහත්වීමෙන් සිදුකළ ඉල්ලීමට ඉතාම කඩිනමින් ප්‍රතිචාර දැක්වීම පිළිබඳව අධිකරණ අමාත්‍ය ගරු විජේදාස රාජපක්ෂ මහතාට ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ ස්තූතිය පුදකර සිටින බව ද ඒ මහත්මිය පැවසුවාය.

එසේම මෙම අවස්ථාව මෙරට පවතින ගැටලු විසඳීම සඳහා පාර්ලිමේන්තු කාරක සභා වඩා සාධනීය ලෙස මැදිහත්වීම පිළිබඳ නිදසුනක් බවද සභාපතිවරිය පෙන්වා දුන්නා ය.

තව ද සංසදයේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් අමාත්‍යාංශ නිලධාරීන් සමග දරුවන් සම්බන්ධයෙන් පළාත් මට්ටමින් දැනට පවතින ගැටලු පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන ලදී.

එහිදී “ළමා ආරක්ෂණය” සම්බන්ධයෙන් පළාත් මට්ටමින් සංසදයේ මගපෙන්වීම අනුව යොමු කර ඇති ගැටලු හා යෝජනා ඇතුළත් තොරතුරු අමාත්‍යාංශය වෙත කඩිනමින් යොමු කරන ලෙසත්, එම ගැටලු මගහරවා ගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම කඩිනමින් ගන්නා ලෙසත් උපදෙස් ලබා දෙන ලදී.







එසේම සෑම මාස 06කට වරක් සංසදය වෙත එහි ප්‍රගතිය පිළිබඳ දැනුම් දෙන ලෙසත් වැඩිදුරටත් උපදෙස් දෙන ලදී.

රාජ්‍ය අමාත්‍ය ගරු ඩයනා ගමගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ නියෝජ්‍ය සම සභාපති ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, ගරු චන්දිම වීරක්කොඩි යන මහත්ම මහත්මීහු ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.





# විදේශීය ශ්‍රම වෙළඳපොළ වෙත ගුණාත්මක ශ්‍රමිකයින් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳ කෝපා අනු කමිටුවේ අවධානය

**විදේශීය ශ්‍රම වෙළඳපොළ වෙත ගුණාත්මක ශ්‍රමිකයින් ලබාදීම අරමුණුකොටගෙන ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ඒකාබද්ධ සැලැස්මක් සකස්කිරීම පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අනු කමිටුවේදී අවධානය යොමු විය.**

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ ගුණාත්මක භාවයෙන් හා නිපුණතාවයකින් යුතු සංක්‍රමණික ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීම සහ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් අන්තර් අමාත්‍යංශ කමිටුව විසින් සකස් කරන ලද පුහුණු වැඩසටහන සමාලෝචනය කිරීම සඳහා වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා අනු කමිටුව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් මේ මස 19 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදීය.

මෙම කමිටුව සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය, අධ්‍යාපන අමාත්‍යංශය, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යංශය නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී විය.

විදේශ වෙළඳපොළ අරමුණු කරගෙන ගුණාත්මක ශ්‍රමිකයින් පුහුණු කිරීම සම්බන්ධයෙන් මෙම පැමිණ සිටි අමාත්‍යංශ සියල්ලේ එකතුවෙන් ඒකාබද්ධ සැලැස්මක් සකස්කිරීමට මින් පෙර මෙම කමිටුව කරන ලද නිර්දේශයේ ප්‍රගතිය පිළිබඳ මෙහි දී අවධානය යොමු වූ අතර ඒ අනුව විදේශීය වෙළඳපොළ අරමුණු කරගනිමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මේ වන විට පුහුණු වැඩසටහන් සකස්කිරීම පිළිබඳ පැමිණ සිටි නිලධාරීන් අදහස් දැක්වීම සිදු විය. මෙහි දී ග්‍රාමීය මට්ටමේ සිට පුහුණු කිරීම් සහ ප්‍රචාරණයන් මේ සම්බන්ධයෙන් දැනටමත් ආරම්භ කොට ඇති බව පැමිණ සිටි නිලධාරීහු වැඩිදුරටත් පෙන්වා දුන්හ.

එසේම මෙරට ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) වෙනත් රටවල් සමග සමපාතවීම පිළිබඳ අධ්‍යනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ද මෙහි දී සාකච්ඡා විය.

තවද විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි වී ඇති විදේශ රැකියා ඒජන්සිවල බලපත්‍ර තදින් අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ද මෙහිදී අවධානය යොමු විය.

එසේම විදේශ ගත වීමට බලාපොරොත්තු වන පුහුණු ශ්‍රමිකයින්ගේ විනය සකස්කිරීම පිළිබඳව ද මෙම කමිටුවේ දී සාකච්ඡා විය.

මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සඳහන් කළේ විදේශ ගත වන ශ්‍රමිකයින් පුහුණු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවෙන් ලැබිය යුතු සහයෝගය මෙම කමිටුවේ මැදිහත්වීමෙන් ලබාදීමට කටයුතු කරන බවයි. එබැවින් මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු වඩාත් කඩිනම් කිරීමේ අවශ්‍යතාව ද ඒ මහත්මිය විසින් පෙන්වා දෙන ලදි.







# ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය හෙවත් රැමිස් (RAMIS) පද්ධතිය කාර්යක්ෂම කිරීම සඳහා අනු කමිටු දෙකක්

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා කෝපා කමිටුවෙන් නව යෝජනා.



දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා කෝපා කමිටුවෙන් නව යෝජනා කිහිපයක් ඉදිරිපත් කරනු ලැබිණි. එහි දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ආදායම් අයකරගැනීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන පරිගණක පද්ධතියක් වන ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා මෙම යෝජනා ඉදිරිපත් කෙරිණි.



මෙම යෝජනා ඉදිරිපත් වූයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 24 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදීය.



මෙහි දී කෝපා කමිටුව පෙන්වා දුන්නේ මුදල් අමාත්‍යාංශය යටතේ ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සිය බදු ආදායම් එකතු කර ගැනීමේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා 2014 වසරේ දී ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) නම් මෘදුකාංග පද්ධතිය ආරම්භ කොට ඒ සඳහා රුපියල් බිලියන 10ක පමණ ආයෝජනයක් කොට ඇති නමුත් එය මේවන විට නිසි තත්ත්වයෙන් ක්‍රියාත්මක නොවන බවට තොරතුරු ලැබී ඇති බවයි.



උක්ත පද්ධතිය ශක්තිමත් කිරීම වෙනුවෙන් තවත් විශාල මුදලක් මේ වන විට වැයකොට ඇතැයි තමන් විශ්වාස කරන බව පැවසූ සභාපතිවරයා අවධාරණය කළේ තව දුරටත් මේ වෙනුවෙන් මුදල් වියදම් කිරීම ප්‍රතිඵලදායක ද යන්න සොයාබැලීම අත්‍යාවශ්‍ය වන බවයි.

මෙහිදී විගණකාධිපතිවරයා සඳහන් කළේ උක්ත පද්ධතිය සම්බන්ධයෙන් වන සේවා ගිවිසුම සහ ඊට අදාළ මුදල් ගෙවීම් පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තමාට ලබා නොදෙන බවයි. විශේෂයෙන්ම ගිවිසුම ප්‍රකාරව තමාට එම තොරතුරු ලබා දීමට නොහැකි බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවසන බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි කටයුත්තක් බව ද ඔහු වැඩි දුරටත් පෙන්වා දුන්නේ ය.

මෙහිදී දේශීය ආදායම් නිලධාරීන් පෙන්වා දුන්නේ 2014දී ආරම්භ කළ මෙම මෘදුකාංග පද්ධතිය 2017දී ගෙන එන ලද නව දේශීය ආදායම් පනත සමග යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී ඇති බවයි. එමෙන්ම ඔවුන් තවදුරටත් පෙන්වා දුන්නේ උක්ත මෘදුකාංග පද්ධතිය නිර්මාණය කරන ලද සිංගප්පූරු සමාගම සමග එළඹ ඇති ගිවිසුමට අනුව ගිවිසුම් තොරතුරු පිටතට ලබා දීමේ ගැටලුවක් ඇති බවයි. එමෙන්ම මෙම ගිවිසුම රජයන් දෙකක් අතර ඇති කරගත් ගිවිසුමක් නිසා එහි ඉදිරි කටයුතු සඳහා රජයේ මැදිහත්වීම යෝග්‍ය වනු ඇති බවයි.





මේ අනුව මෙම RAMIS පද්ධතිය පිළිබඳ ප්‍රසම්පාදනය ඇතුළු අංශ ගණනාවක් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයන් පෙනීයන හෙයින් මෙම පද්ධතිය රටට ගැලපෙන ආකාරයෙන් ක්‍රියාකාරී මට්ටමට පත් කිරීමේ හැකියාව විමර්ශනය කොට නිගමන ඉදිරිපත් කිරීම සඳහා කෝපා කමිටුව විසින් අනු කමිටු දෙකක් පිහිටුවීමට යෝජනා කරන ලදී.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් නීතිපති දෙපාර්තමේන්තුව එක්ව පිහිටුවීමට නියමිත කමිටුව මගින් රැමිස් (RAMIS) ගිවිසුමට අදාළ නීතිමය තත්ත්වයන් විමසා බැලීම අපේක්ෂා කෙරේ.

මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය එක්ව පිහිටුවනු ලබන කමිටුව මගින් උක්ත මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට නියමිත ය.

අදාළ කරුණු පිළිබඳ නිගමන ඇතුළත් වාර්තා සති 06ක් ඇතුළත රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීමට ද මෙහි දී එකඟතාවය පළවිය.






# විදේශ සේවා නියුක්ති කාර්යාංශය පසු විපරමට කැඳවයි - අමාත්‍යාංශ ලේකම් කරුණු 13 පිළිබඳ පිළිතුරු බඳී

මේ මස 18 වැනිදා කෝප් කමිටුවේ සභාපති ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වූ කෝප් කමිටුව විසින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ කැඳවීම කරන ලද්දේ 2022.12.08 දින කාරක සභා රැස්වීමේදී දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය සඳහා ය. ඒ යටතේ කරුණු 13 ක් සාකච්ඡාවට ගන්නා ලදී.





1. විදේශ සේවා නියුක්ති කාර්යාංශය නියාමන ආයතනයක් ලෙස කටයුතු කිරීම සඳහා සුදුසු ආකාරයට එහි පනත සංශෝධනය විය යුතු බව කෝප් කමිටුව සිය නිර්දේශය පිළිබඳ මතය නැවත ඉදිරිපත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයට විදේශ රැකියා නියෝජිතයෝ දෙදෙනෙක් පත් කරන්නේ කවර හේතු නිසාදැයි අමාත්‍යාංශ ලේකම්වරයා අදහස් දක්වන ලදී. එහි දී කෝප් කමිටුවේ අදහස වුණේ ඒ හරහා ලැදියාවන්ගේ ඝට්ඨනයක් ඇති වෙන බවයි.

කාර්යාංශයේ සමහර කරුණු පිළිබඳ විශේෂඥ අවබෝධයක් අවශ්‍ය නම් ඒ සඳහා වන අනු කමිටුව, කාර්ය සාධන බලකායන් පත් කර අවශ්‍ය උපදෙස් සපයා දිය යුතු බව කෝප් කමිටුවේ අදහස විය. එම නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නියාමන ආයතනක් ලෙස ක්‍රියාත්මක වීම සඳහා ගැලපෙන ආකාරයට පනත සංශෝධනය කරගැනීමට නිර්දේශ කරන ලදී.





2. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සුබසාධන අරමුදල සඳහා වන වෙනම ගිණුමක් පවත්වාගෙන යාමට කෝප් කමිටුව කරන ලද නිර්දේශ නැවත සාකච්ඡාවට ගැනිණි. විගණකාධිපතිවරයා විශේෂයෙන් සඳහන් කරන ලද්දේ, කාර්යාංශයේ සුබසාධන ගිණුම සම්බන්ධයෙන් වෙනම මූල්‍ය ප්‍රකාශනක් හා ගිණුම් කට්ටලයක් පවත්වාගෙන යායුතු බවයි. එමෙන්ම අරමුදල විගමන සුභ සාධනය සඳහා පමණක් යොදා ගත යුතු බවයි. ඊට විදේශ සේවා නියුක්ති කාර්යාංශය එකඟතාවය පළ කරන ලදී.

3. කුවේට් අරමුදල එලදායී ලෙස ලබා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා විය. ඒ පිළිබඳ සවිස්තර සටහනක් ලේකම්වරයා කමිටුව වෙත යොමු කිරීමට එකඟ විය.

4. කාර්යාංශය විසින් ගෙවීම් හා දීමනා සම්බන්ධයෙන් අදාළ ආයතනවලින් විධිමත් අනුමතිය ලබාගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ද කරුණු සාකච්ඡා විය. ඒ වෙනුවෙන් විගණකාධිපතිවරයාගේ මතය ක්‍රියාවට නැංවීමට යෝජනා කෙරිණි.

5. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීන්දු තීරණ පිළිබඳව විශේෂ කමිටුවක් පත් කිරීම පිළිබදව විගණකාධිපතිවරයාගේ මතය ක්‍රියාවට නැංවීමට තීන්දු විය.



6. රක්ෂණාවරණ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගෙන් විශේෂ වාර්තාවක් කැඳවීමට තීන්දු විය.

7. කාර්යංශයේ සිදුවී ඇතැයි සැලකෙන යම් යම් දූෂණ සහ අක්‍රමිතා සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය සම්බන්ධ කරගනිමින් පරීක්ෂා කිරීමට පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සම්බන්ධයෙන් කළ නිර්දේශ පිළිබඳ නැවත සාකච්ඡාවට ගැනිණි.

8. විදේශ දූත මණ්ඩලවලට නිලධාරීන් පත් කිරීම පිළිබඳව අනුගමනය කරන ක්‍රමවේදයන් පිළිබඳව කෝප් කමිටුවට තම නිර්දේශ කඩිනමින් ඉදිරිපත් කරන බව ලේකම්වරයා පොරොන්දු විය.



9. විදේශ සේවා නියුක්ති කාර්යාංශය ක්‍රමානුකූලව ව්‍යාපාරික කටයුතුවලින් බැහැර වී නියාමන ආයතනයක් ලෙස කටයුතු කිරීමේ භූමිකාව සකස් කිරීම සඳහා අවශ්‍ය පනත් සංශෝධනය කරමින් නීති රීති සකස් කර ගැනීමට කෝප් කමිටුව නිර්දේශ සැලකිල්ලට ගනිමින් සංයුක්ත සැලැස්ම 2023/02/09 දින කෝප් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට ද නිර්දේශ කරන ලදී.

10. දැනට කාර්යාංශය කරනු ලබන පුහුණු වැඩසටහන් ක්‍රමයෙන් අදාළ රාජ්‍ය ආයතනවලට භාරදීමට නිර්දේශ කෙරුණි. විදේශ සේවා නියුක්ති කාර්යාංශය වානිජ හා ව්‍යාපාර කටයුතුවලින් බැහැර වී ව්‍යාපාර කටයුතු සඳහා පිහිටවා තිබෙන ආයතන සමග කටයුතු කරන්නේ කෙසේදැයි කරුණු වාර්තාකරන ලෙස අමාත්‍යංශ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටින ලදී.

11. දැනට කාර්යාංශය සතු පුහුණු ආයතනවල තත්ත්ව පරීක්ෂාවක් කර වාර්තාවක් ඉදිරිපත් කිරීම ට නිර්දේශ කෙරුණි.



12. මහා භාණ්ඩාගාර නියෝජිතයන් රාජ්‍ය ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරන අවස්ථාවල රජයේ නීති රීතිවලට පටහැනිව එම ආයතන විසින් ගනු ලබන තීරණයන්ට තමන්ට එකඟ විය නොහැකි අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් අදාළ විරෝධය ලිඛිතව භාණ්ඩාගාර ලේකම්වරයා හරහා විගණකාධිපතිවරයා සහ කෝප් කමිටුව දැනුවත් කිරීමයි.

මෙම නිර්දේශ සියල්ලෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් කමිටුවේ දී දීර්ඝ ලෙස සාකච්ඡා වූ අතර කාරක සභාව මෙම නිර්දේශ සම්බන්ධයෙන් තවදුරටත් සිදු කළ යුතු ඉදිරි පියවර පිළිබඳව ද පැහැදිලි කරන ලදී.

# නිලධාරීන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් සුභසාධක ප්‍රතිලාභීන්ගේ විනිවිද බවකින් යුතු නාමලේඛනයක් තවමත් සකස් කිරීමට නොහැකිවෙලා - රජයේ මුදල් පිළිබද කාරක සභාවේදී අනාවරණය වෙයි

- පනතේ 21 සහ 22 වගන්ති මගින් සාවද්‍ය තොරතුරු සැපයුවොත් නිලධාරීන් ද දඩුවමකට යටත් වීම හේතුවයි.
- IMF යෝජනාවක් ද වන නිසා කඩිනමින් මෙම ගැටලුව විසඳා ගැනීමේ අවශ්‍යතාව කාරක සභාව අවධාරණය කරයි.

සමෘද්ධි ප්‍රතිලාභ ගෙවීමේ දී විනිවිද බවකින් යුතුව එම ප්‍රතිලාභ ලැබිය යුතු තැනැත්තන් හදුනා ගනිමින් ලේඛනයක් සකස් කිරීම සදහා දත්ත ලබා ගැනීම සමෘද්ධි නිලධාරීන් ප්‍රතික්ෂේප කිරීම තුළ ගැටලුකාරී තත්ත්වයක් ඇති වී ඇති බව මේ මස 10 වැනිදා පැවති රජයේ මුදල් පිළිබද කාරක සභාවේ දී අනාවරණය විය.

එම කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අංක 2302/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග සැලකිල්ලට ගත් අවස්ථාවේ දී මෙම කරුණු අනාවරණය විය.

මෙලෙස සමෘද්ධි ඇතුළු සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ දී දූෂණවලින් තොරව විනිවිද බවකින් යුතුව එම කටයුතු සිදුකිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනාවක් බවත් ඒ අනුව ඒ සදහා වගකීම පැවරෙන්නේ  සුභ සාධක ප්‍රතිලාභ මණ්ඩලයට බවත් මෙහි දී වැඩිදුරටත් හෙළිවිය. ඒ අනුව එම දත්ත රැස් කිරීමේ කටයුතුවලට අවශ්‍ය විධිවිධාන සදහා මෙම ගැසට් පත්‍රයේ නියෝග පළකොට තිබිණි.

ඒ අනුව මෙහි දී අදහස් දැක් වූ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති බී. විජේරත්න මහතා පවසා සිටියේ ලියාපදිංචි අයදුම්කරුවන්ගේ නිවෙස් වෙත ගොස් පනතේ විධිවිධාන අනුව අයදුම්කරුවන් විසින් කරනු ලබන ප්‍රකාශයට අදාළ දත්ත සහ තොරතුරු ලබා ගැනීමේ දී පනතේ 21 සහ 22 වගන්ති අනුව සිය රැකියා අහිමිවීමට පවා ඉඩ ඇති බව පෙන්වා දෙමින් එකී වගන්ති සංශෝධනය කරන තුරු මෙම ක්‍රියාවලියට අදාළ සියලු ක්ෂේත්‍ර රාජකාරීවලින් ඉවත්වන බව සමෘද්ධි නිලධාරීන්, ග්‍රාමනිලධාරීන්, ආර්ථික සංවර්ධන





නිලධාරීන්ගේ වෘත්තීය සමිති දන්වා ඇති බවයි.

මෙම 21 සහ 22 වගන්තිය මගින් සාවද්‍ය දත්ත ඇතුළත් කරන නිලධාරීන් ද දඩුවමකට යටත්වන බැවින් මෙසේ එම වගන්ති සංශෝධනය වනතුරු මෙම දත්ත එකතු කිරීම ප්‍රතික්ෂේප කොට ඇති බව ද ඒ මහතා පෙන්වා දෙන ලදී. රජයේ සුබ සාධක ලැබීම් සදහා සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් / පවුල් හඳුනා ගැනීම සදහා මූලික අයදුම්පත් භාර ගැනීම පසුගියදා අවසන් වී තිබිණි. එසේම සුබසාධක ප්‍රතිලාභ ඉල්ලුම් කර ඇති අයදුම් කරුවන්ගේ නිවෙස් වෙත ගොස් ද්වීතීයික තොරතුරු එක්රැස්

කිරීම සඳහා ජංගම යෙදවුම් මෘදුකාංගයක් ද හඳුන්වා දුන් බව ද සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා මෙහි දී පැවසීය. මෙහි දී කමිටුවේ දී සාකච්ඡා වූයේ සමෘද්ධිලාභීන්ගෙන් 40% ආසන්න ප්‍රමාණයක් නුසුදුසු පුද්ගලයන් බව ලෝක බැංකු සමීක්ෂණයක දී ද හෙළිවී ඇති බවයි. ඒ අනුව නුසුදුසු පුද්ගලයන්ට දීමනාව ලබා දී ඉන් යම් ප්‍රතිශතයක් ලබා ගන්නා ඇතැම් දූෂිත නිලධාරීන්ද සිටින බව මෙහිදී සාකච්ඡා විය. මනා විනිවිද බවකින් යුතුව මෙම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ කටයුතු සිදු කිරීම සඳහා මෙම නිවැරදි දත්ත සහිත ලේඛනයක් සකස් කිරීම අත්‍යවශ්‍ය බව කාරක සභාවේ දී අවධාරණය කෙරිණි.

එසේම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත අනිවාර්ය කළයුතු බවට ද කාරක සභාව විසින් නිර්දේශයක් ද ලබා දෙන ලදී. තාක්ෂණය මෙතරම් දියුණු මට්ටමක ඇති පසුබිමක ජාතික හැඳුනුම්පතක් සෑම පුරවැසියෙකුටම ලබාදීමට හැකියාවක් නොමැති බව පිළිගත හැකි කරුණක් නොවන බව ද වංචනික ක්‍රියාවන් නැවැතීමට එය වැදගත් තීරණයක් වනු ඇති බව ද කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

මේ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ලබා ගැනීම පමාවීමටත් මෙම ලේඛනය සකස් කිරීම පමාවීම හේතුවිය හැකි බැවින් ද දූෂණය හා වංචාවෙන් තොර සංස්කෘතියක් ඇති කිරීම සඳහා ද කඩිනමින් මෙම ගැටලුව විසදා ගැනීමේ අවශ්‍යතාව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

ඒ අනුව මෙම ගැසට් පත්‍රය සඳහා අනුමතිය ලබා දුන් කාරක සභාව මුදල් අමාත්‍යාංශ ඉහළ නිලධාරීන්ට සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයාට උපදෙස් දුන්නේ මේ සම්බන්ධව කඩිනමින් සාකච්ඡා කොට විසඳුමකට පැමිණෙන ලෙසයි. එසේම විකල්ප ක්‍රියාමාර්යක් හෝ අනුගමනය කරමින් මෙම දත්ත රැස්කිරීමේ කටයුතු කඩිනමින් සිදුකිරීමට අදාළ තීරණ ගන්නා ලෙස ද කාරක සභාව විසින් මෙහි දී නිර්දේශ කරන ලදී.

එසේම එම ප්‍රගතිය සති දෙකක් තුළ කාරක සභාවට වාර්තා කරන ලෙස ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හර්ෂද සිල්වා මහතා අදාළ පාර්ශ්වයන්ට උපදෙස් ලබා දුන්නේ ය.







# කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා නිලධාරීන් ලෙස වඩාත් වගකීමෙන් කටයුතු කළ යුතුයි - රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අප්‍රසාදය පළ කරයි

■ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සඳහා නිල වෙබ් අඩවියක් නොමැති බවත් හෙළි වෙයි.

■ විගණන වාර්තා පාර්ලිමේන්තුවට ලබාදීමේ ප්‍රමාදය පිළිබඳව කමිටුව කොමිෂන් සභාවෙන් ප්‍රශ්න කරයි.





කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් රජයේ මුදල් පිළිබද කාරක සභාවට සහභාගී නොවීම සහ ඒ පිළිබදව විධිමත්ව කාරක සභාව දැනුවත් නොකිරීම පිළිබදව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 05 වැනිදා රැස් වූ රජයේ මුදල් පිළිබද කාරක සභාවේ දී අප්‍රසාදය පළ විය.

දෙසැම්බර් 21 වැනිදා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ ඉහළ නිලධාරීන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවා තිබුණ ද ඊට සහභාගී නොවීම පිළිබද සාධාරණ පැහැදිලි කිරීමක් ලිඛිතව ඉදිරිපත් කරන ලෙස රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් කොමිෂන් සභාවේ ලේකම්වරයාට මෙහි දී උපදෙස් ලබා දෙන ලදී.

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ ඉදිරිපත් කර තිබූ රෙගුලාසි, ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතීත්වයෙන් පැවති රජයේ මුදල් පිළිබද කාරකසභාවේ දී මේ මස සැලකිල්ලට ගත් අවස්ථාවේදී මෙම කරුණු අවධාරණය කෙරිණි.

ආයෝජන උත්පාදනය සඳහා වරාය නගර ව්‍යාපෘතියේ වැදගත්කම අවධාරණය කළ කාරක සභාව මෙතෙක් සිදු කර ඇති කාර්යයන් සතුටුදායක මට්ටක නොමැති බවද පැවසීය. මෙවැනි ව්‍යාපෘති හසුරුවන වෘත්තිකයන් ලෙස වඩා වගකීම් සහගත බවකින් ක්‍රියාත්මක විය යුතු බව මෙහි දී කමිටුව විසින් පැමිණ සිටි නිලධාරීන්ට පෙන්වා දෙන ලදී.

විශේෂයෙන්ම කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව මගින් සිදුකරන ලියාපදිංචි කටයුතු සහ අයදුම් කිරීමේ කටයුතු අන්තර්ජාලය හරහා සිදුකිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරන සන්දර්භයක් තුළ නිසි මාර්ගගත (ඔන්ලයින්) වැඩපිළිවෙළක් හෝ වෙබ් අඩවියක් නොතිබුණේ මන්දැයි කාරක සභාව මෙහි දී විමසා සිටියේය. ඒ අනුව එම ගැටලුව විසඳීමට අවශ්‍ය පියවර කඩිනමින් ගන්නා ලෙස කාරක සභාව විසින් පැමිණ සිටි කොමිෂන් සභා නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

තවද, විගණන වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය පිළිබඳවද කාරක සභාවේ අවධානය යොමු වියී වාර්ෂික විගණන වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීම සහතික කරන ලෙස කාරක සභාව කොමිෂන් සභා නිලධාරීන්ට නියෝග කළේය.

කැසිනෝ ව්‍යාපාරය නියාමන වැඩපිළිවෙළක් සකස් කිරීම පිළිබදව අධීක්ෂණය සදහා අනුකමිටුවක් ස්ථාපනය කළ බව රජයේ මුදල් පිළිබද කාරක සභාවේ සභාපති ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා මෙහිදී සදහන් කළේය. පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතාගේ සභාපතීත්වයෙන් යුතු මෙම අනුකමිටුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු චන්දිම වීරක්කොඩි, ගරු එම්.ඒ සුමන්තිරන්, ගරු මයන්ත දිසානායක සහ ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර යන මහත්වරු ඇතුළත් බවද ඒ මහතා පැවසීය.














# ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වාගත යුතුයි - පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) මධුර විතානගේ

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතාවක් පවත්වාගත යුතු බව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) මධුර විතානගේ මහතා පැවසී ය.



පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (නීතිඥ) මධුර විතානගේ මහතා මේ බව සඳහන් කළේ 'ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳ සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඒ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 12 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේ දී ය.



මෙම කමිටුව සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසුකිරීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති ජනාධිපති කාර්ය සාධන බලකායන් 8 ක් නියෝජනය කරමින් නිලධාරීන් පැමිණ සිටි අතර ඔවුහු ඉදිරිපත්කිරීම් සහිතව (Presentations) ඒ ඒ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකය ඉහළ නැංවීමට අදාළ ගැටලු සහ යෝජනා පෙන්වා දෙන ලදි.

මෙහි දී ප්‍රධාන වශයෙන් ව්‍යාපාර සම්බන්ධයෙන් මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ කරුණු සහ ඉඩම් ඇතුළු දේපළ ලියාපදිංචියට අදාළ ක්ෂේත්‍රවල කරුණු පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර මේ පිළිබඳව කමිටුවේ අදහස වූයේ අදාළ ක්ෂේත්‍රවල කටයුතු කිරීමේදී මාර්ගගත තාක්ෂණය (Online) යොදාගැනීමෙන් එම කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවිය හැකි බවයි. එසේම නව ව්‍යාපාර ආරම්භ කිරීම සහ ව්‍යවසායකයන් දිරි ගැන්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාදිය හැකි සහයෝගය පිළිබඳව ද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා විය.





# ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය මුහුණපා ඇති ගැටලු පිළිබඳ ජාතික සභා අනුකාරක සභාවේ අවධානය

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය මුහුණපා ඇති ගැටලු පිළිබඳ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනුකාරක සභාවේ දී සාකච්ඡා විය.







මේ පිළිබඳ සාකච්ඡා වූයේ ආර්ථික ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනුකාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 11 වැනි දා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේ දී ය.

මෙම කාරක සභාව සඳහා මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශ නියෝජනය කරන පාර්ශ්ව කිහිපයකම නියෝජිතයින් සහභාගී වූ අතර මේ වන විට එම ක්ෂේත්‍රයේ පවතින ගැටලු පිළිබඳ ඒ ඒ පාර්ශ්වවල අදහස් ලබාගැනීම සිදු විය.

මෙහිදී පැමිණ සිටි නියෝජිතයින් පෙන්වා දුන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ සෘජු රැකියාවල නියුතුවන්නන් 650,000 ක් පමණ හා වක්‍ර රැකියාවල නියුතුවන්නන් ආසන්න වශයෙන් 700,000 ක් පමණ සිටින බවයි. නමුත් වර්තමානය වන විට ඉදිකිරීම් ක්ෂේත්‍රය කඩා වැටීමකට ලක් වී ඇති බවත් මේ නිසා මෙම රැකියාලාභීන් අර්බුදයකට මුහුණපා ඇති බවත් ඔවුහු පෙන්වා දුන්හ.

එසේම දැනට ඉදිකොට ඇති මහල් නිවාස සහ කාර්යාල වැනි ඉදිකිරීම් අලෙවි කර ගැනීමට අපහසු තත්ත්වයක් ඇති වී තිබෙන බවද මෙම පාර්ශ්ව පැවසුහ. තව ද මේ වන විට ඉදිකොට ඇති ඉදිකිරීම්වලින් කොටසක් සඳහා රජය විසින් ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් බැංකු ණය ගෙවාගැනීමට අපහසු වූ විශාල පිරිසක් සිටින බව ද පැමිණ සිටි පාර්ශ්ව පෙන්වා දුන්හ.

එසේම ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ පුද්ගලයින් රට හැරයාමේ ප්‍රවණතාවක් ඇති වී තිබෙන බව ද මෙහි දී අනාවරණය විය. මෙහිදී අදහස් දැක්වූ අනුකාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා සඳහන් කළේ මෙම ගැටලු සඳහා මුදල් අවශ්‍ය වන විසඳුම්, මුදල් අවශ්‍ය නොවන විසඳුම් සහ නීතිමය විසඳුම් වෙන වෙනම හඳුනාගෙන වෙන වෙනම ක්‍රියාත්මක නොවුණහොත් රටේ ඉංජිනේරු ක්ෂේත්‍රය විශාල බිඳ වැටීමකට ලක්වන බවයි. මේ නිසා කඩිනමින් මේ පිළිබඳ වූ යෝජනාවන් ද පාර්ලිමේන්තුවට සහ රජයට ඉදිරිපත්කිරීමට බලාපොරොත්තු වන බව හෙතෙම පැවසීය.

# මාධ්‍ය වාර්තා කළ ආකාරයට දුම්රිය ගමන් වාර අවලංගු නොවූ බව අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පෙන්වා දෙයි

- දුම්රිය ගමන්වාර අවලංගුවීම නැවැත්වීමට මෙම මස අවසන් වන විට වැඩපිළිවෙළක්.
- නව දුම්රිය කාලසටහනක් පෙබරවාරි මුල දී
- දුර ගමන් දුම්රිය ප්‍රවේශපත් 100%ක්ම මාර්ග ගත ක්‍රමයට මිල දී ගැනීමට අවස්ථාව ලබාදීම පිළිබඳ අවධානය.

මාධ්‍ය මගින් වාර්තා කළ ආකාරයට සේවකයින් විශ්‍රාම යෑම හේතුවෙන් දුම්රිය ගමන් වාර අවලංගු නොවූ බව ප්‍රවාහන හා මහාමාර්ග සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා පැවසී ය.

ඒ මහතා මේ බව පැවසුවේ ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් මේ මස 05 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදීය.

මෙහි දී පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විශ්‍රාම යාම හේතුවෙන් යම් දුම්රිය වාර සංඛ්‍යාවක් අවලංගු කිරීමට වුව ද එය මාධ්‍ය මගින් වාර්තා කළ අකාරයේ වැඩි දුම්රිය ගමන් වාර සංඛ්‍යාවක් නොවන බවයි. සුළු දුම්රිය වාර සංඛ්‍යාවක් අවලංගු වූ විට එය විශාල ප්‍රමාණයක් ලෙස මාධ්‍ය මගින් පෙන්වීම සිදු කළ බව ද එම නිලධාරීහු පෙන්වා දුන්හ.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා පැවසුවේ කටුනායක ගුවන්තොටුපළට වැඩි සංචාරකයින් ප්‍රමාණයක් පැමිණීම නිසා ඉන්ධන සැපයීම සඳහා වැඩි දුම්රිය සංඛ්‍යාවක් පසුගිය දිනවල යෙදවීමට සිදු වූ බවත්, එම හේතුව නිසාවෙන් ද දුම්රිය ධාවනය තරමක් අවම කිරීමට සිදු වූ බවත් ය. එසේම මාධ්‍ය වාර්තා කළ ආකාරයට දුම්රිය ගමන්වාර අවලංගු නොවූ බවට ඉදිරියේ දී කරුණු පෙන්වා දීමට බලාපොරොත්තු වන බවද ඒ මහතා පැවසීය.

තව ද නිලධාරීන් විශ්‍රාම යාම හේතුවෙන් යම් දුම්රිය වාර සංඛ්‍යාවක් අවලංගු වූයේ නම් එය ද මෙම මස අග වන විට අවසන් කිරීමට ඇති හැකියාව පිළිබඳ අමාත්‍යවරයා මෙහිදී පැමිණ සිටි නිලධාරීන්ගෙන් විමසූ අතර,එහිදී නිලධාරීන් පැවසුවේ ඒ සඳහා අවශ්‍ය පත්කිරීම් මේ වන විටත් සිදු කරමින් පවතින නිසා මේ මස අග වන විට එය සිදු කළ හැකි බවයි. එසේම පසුගිය වසර අග දී විශ්‍රාම ගොස් ඇත්තේ දුම්රිය රියදුරන් 10 දෙනෙකු පමණක් බවත් ඔවුහු පැවසූහ.

එසේම එළඹෙන පෙබරවාරි මුල දී පවතින ධාරිතාව අනුව නව දුම්රිය කාලසටහනක් ලබාදීමට කටයුතු කරන බවද අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා පැවසීය.
මීට අමතරව "ඇල්ල-ඔඩිසි" වැනි සංචාරක ආකර්ෂණය සහිත දුර ගමන් දුම්රිය සේවාවන් සඳහා ප්‍රවේශපත් මිල දී ගැනීම 100% ක්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇනවුම් කිරීමේ හැකියාව පිළිබඳව ද මෙහි දී සාකච්ඡා විය.








# පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හුංගම විජයබා විද්‍යාලයේදී

පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ හුංගම විජයබා විද්‍යාලයේ දී මේ මස 09 වැනිදා පැවැත්විණි.

පාර්ලිමේන්තු ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා සහ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩ බලන) එච්.ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

හුංගම විජයබා විද්‍යාලය විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා එම විදුහලේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ සභිකයන්, ශිෂ්‍ය නායකයින් ඇතුළු ආරාධිත පාසල් 5ක ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ද සහභාගී වූහ.

මෙහිදී පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරයෙකුගේ කාර්යභාරය පිළිබඳ නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් දේශනයක් සිදු කළ අතර එහි දී ඒ මහතා සඳහන් කළේ පාර්ලිමේන්තුවෙන් විශාල කාර්යභාරයක් සිදු කරන බවත් මාධ්‍ය මගින් එය නිසියාකාරව පුරවැසියන් වෙත සන්නිවේදනය නොකරන බවත් ය. මේ නිසා පාර්ලිමේන්තුව පිළිබඳ පුරවැසියන් තුළ ගොඩනැගී ඇති ආකල්පය එතරම් යහපත් නොවන බවයි. එබැවින් මාධ්‍ය මගින් පාර්ලිමේන්තුව සිදු කරන කාර්යභාරය නිවැරදිව ජනතාව වෙත ගෙනයාමේ වැදගත්කම ද ඒ මහතා විසින් අසඳහන් කරන ලදි.

එසේම අපේ පාර්ලිමේන්තුව සහ අනාගත පුරවැසියාගේ දායකත්වය යන මාතෘකාව යටතේ පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා සිය දේශනය සිදුකළ අතර, පාර්ලිමේන්තුවේ කාරයභාරය හා ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය යන මාතෘකාව යටතේ අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායකසේවා) සහ වැඩබලන අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩබලන) එච්.ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් සිය දේශනය ඉදිරිපත් කරන ලදි.

මෙම විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර කිහිපය පුරා අඛණ්ඩව සිදු කරන ලද දැනුවත් කිරීම් පෙළක තවත් අදියරකි.













# පාර්ලිමේන්තුව සැකෙවින්...

## ජනවාරි 2023



මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

## ජනවාරි

### 05 බ්‍රහස්පතින්දා

- 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පත පළමුවැනි වර කියවීම.

- බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබාගැනීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවා විවාද කර තුන්වැනි වර කියවීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීම.

### 17 අඟහරුවාදා

- මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට දැනුම් දීම.

- පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) (පනත් කෙටුම්පත් අංක 126) සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) (පනත් කෙටුම්පත් අංක 160) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් දෙක දෙවැනි වර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම.

- බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබාගැනීමේ පනත් කෙටුම්පතට 2023 අංක 1 දරන පනත වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.

### 18 බදාදා

- පුනරුත්ථාපන කාර්යාංශය පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා පක්ෂව ඡන්ද 23 ක්ද, විපක්ෂව ඡන්ද 6ක්ද ලැබුණු අතර තෙවැනි වර කියවා සංශෝධිතාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

### 19 බ්‍රහස්පතින්දා

මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත දෙවැනි වර කියවා, තුන්වනවර කියවීම සඳහා ඡන්ද විමසීමක් සිදු වූ අතර පක්ෂවව ඡන්ද 97ක්ද, විරුද්ධව ඡන්ද 36ක්ද වශයෙන් සංශෝධිතාකාරයෙන් එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී

### 24 අඟහරුවාදා

පුනරුත්ථාපන කාර්යාංශය පනත් කෙටුම්පත 2023 අංක 2 දරන පනත වශයෙන් ද, මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත් කෙටුම්පත 2023 අංක 3 දරන පනත වශයෙන් ද, කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් සහතිකය සටහන් කිරීම.

### 27 සිකුරාදා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුව මධ්‍යම රාත්‍රියේ සිට බලපවත්වන පරිදි වාරාවසාන කරනු ලැබීම.





**2023 නව වසරට ආශිර්වාද පතා පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ පිහිටි ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියසදී විශේෂ බෝධි පූජා පිංකමක් මේ මස 04 වැනිදා පෙරවරුවේ පැවැත්විණි.**


## පාර්ලිමේන්තු ජායා ගැලරිය















ආදිවාසි නායක ඌරුවරිගේ වන්නිලැත්තෝ ප්‍රමුඛ මෙරට වෙසෙන ආදිවාසි ප්‍රජාවගේ නායකයෝ රැසක් මේ මස 17 වැනිදා පාර්ලිමේන්තුවට පැමිණ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන සහ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස යන මහත්වරු හමුවූහ.















# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I 31 වැනි කාණ්ඩය I ජනවාරි 2023
ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka